IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පරීක්ෂණය - 2013
## ප්‍රථම සෙමෙස්තරය
(පවත්වන ලද්දේ 2014 සැප්තැම්බර්)

# DY 03 – ආර්ථික විද්‍යාව

**විභාග අපේක්ෂකයින්ට උපදෙස් :**

(1) පහත දක්වා ඇති උපදෙස් පිළිපදිමින් ප්‍රශ්න හතරකට **(04)** පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පෑ තුනයි. **(03)**

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් **(05)** සහ පිටු දෙකකින් **(02)** සමන්විතවේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) විභාගය අවසානයේදී සියලුම පිළිතුරු පත්‍ර එකට ගැට ගැසිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01

i. ආර්ථික විද්‍යාවට අදාල නිර්වචන 3ක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 05)

ii. "ආර්ථික විද්‍යාව සමාජ විද්‍යාවකි". මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. "හිඟකම යනු ඕනෑම ආර්ථිකයක් මුහුණ දෙන පොදු අභියෝගයකි". ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 15)
(මුළු ලකුණු 25)

02 "ආර්ථිකයක සාර්ව ආර්ථික කළමනාකරණ ක්‍රියාවලිය" පැහැදිලි කරන්න.

(ලකුණු 25)

03

i. ධනවාදී ආර්ථිකයක මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. "ඕනෑම ආර්ථිකයක් සාධාරණ ආදායම් ව්‍යාප්තියක් අපේක්ෂා කරයි. එබැවින්, සමාජවාදී ආර්ථික ක්‍රමයක් සැමවිට ආර්ථිකයට යහපත් ප්‍රතිපල ගෙනත් දේ". ඉහත ප්‍රකාශයට පක්ෂව හා විපක්ෂව කරුණු දක්වමින්, එම ප්‍රකාශය විස්තර කරන්න.

(ලකුණු 15)
(මුළු ලකුණු 25)

04

i. "ඕනෑම ආර්ථිකයක සමස්ථ නිපැයුම් ප්‍රමාණය එම ආර්ථිකය සතු නිෂ්පාදන ප්‍රමාණය මත රඳා පවතී". ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ශ්‍රමයෙහි විශේෂ ලක්ෂණයන් දක්වා ශ්‍රමය, ප්‍රාග්ධනයෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. "නූතන තාක්ෂණයේ දියුණුව, ව්‍යවසායකත්වයේ වර්ධනයට හේතුවේ". ඉහත ප්‍රකාශය උදාහරණ සපයමින් ශ්‍රී ලංකාව ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 25)

05 පහත සඳහන් සංකල්පයන් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. භූමියෙහි ලක්ෂණ
ii. මිනිස් වුවමනාවන්
iii. ආර්ථික භාණ්ඩ හා ආර්ථික නොවන භාණ්ඩ
iv. භාණ්ඩ හා සේවා
v. පරිභෝජන භාණ්ඩ හා සුඛ සාධන භාණ්ඩ

(ලකුණු 05 X 5 = 25)